# අපේ ගෙදර අවුරුදු .....



විපුලි අධීසා දිව්‍යාංජලී

# අපේ ගෙදර අවුරුදු


විපුලි අධීසා දිව්‍යාංජලී

කතෘ


කතෘගේ වෙනත් කෘති

කම්මැලි පූස් පැටියා

අපූරු උපන්දින තෑග්ග


මහ/මහමායා බාලිකා විද්‍යාලය

5-A



2026.05.10

ISBN

978-624-211-104-9

# පිදුම

සිහිනයකට නාවත් ඇත්තු
බෝසතෙක් මෙන් මා රැකගත්තු
අම්මාට....

හිස මත නොදුටුවත් මිණි ඔටුනු
රජෙක් වාගේම පෙනුණු
තාත්තාට....

මා හට සිප්සතර කියාදුන්
ගුරු මෑණිවරුන්ට....

පුදදෙමි
මේ පොත සදාදර
සිතින්....



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

මේ අවුරුද්දේ මාස
වේගයෙන් ගෙවී
ගියා.සිංහල දෙමළ අලුත්
අවුරුද්ද උදා වන තුරු
මම ඇඟිලි ගනිමිනුයි
හිටියේ.






අලුත් අවුරුදු උත්සවය
ගැන සිතමින් මම කාලය
ගත කරමින් සිටියා.

අප්‍රේල් මාසය උදා
වුණා.මම උදෑසන ම අවදි
වී දින දර්ශනයේ මාර්තු
මාසයේ කොළය ඉවත්
කරා.






පාසලේ අවුරුදු නිවාඩු
දීමට ඇත්තේ තව දින
කිහිපයකි.

මේ දින වල කොහාගේ
හඬ නිතරම
ඇසෙනවා.අපේ පවුල
හරිම කාර්ය
බහුලයි.තාත්තා සහ
අයියා වත්ත පිරිසිදු
කරනවා.



මල්ලිත් පුංචි වුනත් උදවු
කරනවා අම්මයි මමයි
ගෙදර අස් පස් කරා.

## පාසලේ නිවාඩු ලබා දුන්නා.




එදිනමා පවුලේ හැමෝම
ඇඳුම් ගන්න නගරයට
ගියා.අයියා රතිඤ්ඤා
පෙට්ටියකුයි,අහස්කුරුග
ත්තා.මල්ලි අඬලා
අඬලා කොහොම හරි
අයිස් ක්‍රීම් එකක් කෑවා.



අද පරණ අවුරුද්ද,අලුත්
අවුරුද්දට තව දවස්
එකයි.

අම්මා අපේ ඔළුවේ තෙල්
ගෑවා.මම "ඒ මොනවද"
කියලා ඇහුවා."මේ නානු
මේවා ගාලා තමයි පරණ
අවුරුද්දට නාන්නේ"
අම්මා කිව්වා.




අද අලුත් අවුරුදු දවස,
මම උදෙන්ම අවදි
වුණා.ඒත් මල්ලි තවම
නිදි.



අලුත් අවුරුද්දාවට තව
ඇත්තේ පැය
කිහිපයකි.අයියා එයාගේ
රතිඤ්ඤා සුදානම්
කරනවා මම දැක්කා.

අලුත් අවුරුද්ද උදාවුණා.
මුළු ගමේම රතිඤ්ඤා
හඬ විතරමයි.අයියත්
රතිඤ්ඤා පත්තු
කරනවා.
කොහාගේ නාදය තවත්
වැඩි වුණා.






"මීළඟ නැකත ආහාර
පිසීම".අම්මා
කිව්වා.අලුතින් ගෙනාපු
මැටි මුට්ටියේ කිරි උතුර
වන්න සූදානම්
වුණා.නැකත
උදාවුණා.ආයෙත් ගම
පුරාම රතිඤ්ඤා හඬ
විතරමයි.


"ඊට පස්සෙ තියෙන්නේ
ආහාර
අනුභවය,ගනුදෙනු කිරීම
හා වැඩ ඇල්ලීම"මල්ලි
කෑ ගසා කිව්වා.නැකත
උදා වූ පසු අම්මා ළිඳ
සමග ගනුදෙනු කරා. ඉන්
පසුව අම්මා අපිට
කැවුම්, කිරිබත් කැව්වා.



අපි ගමේ තිබුණු අවුරුදු
උත්සවයට සහභාගි
වුණා.අවුරුදු උත්සවේ
අවුරුදු කුමාරයා තරඟයේ
මල්ලි අවුරුදු කුමාරයා
වුණා.මම බැලුම් පිපිරවීමේ
තරඟයේ
පළවෙනියා,අයියත් කනා
මුට්ටි බිඳීමේ තරඟයෙන්
දිනුවා අපි හැමෝටම හරිම
සතුටුයි.



හිස තෙල් ගෑමේ නැකතට
අපි ගියේ අත්තම්මලාගේ
ගෙදරටයි.හිස තෙල්
ගාන්නෙත් අපි ඉන්න තැන
උඩිනුයි,කකුල් දෙක ළඟයි
කොළ වර්ග
තිබුණා.අත්තම්මලාගේ
ගෙදරට ගමේ ගොඩක්
දෙනා ආවා.



ගෙදර ළඟ අයියලා
අක්කලා එක්ක අපේ අඹ
ගහේ අඹ කඩලා
අච්චාරු හදලා කෑවා.
මේ අලුත් අවුරුද්ද අපිට
කවදාවත් අමතක
වෙන්නේ නෑ.



# පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.
මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)